ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

## ගම්පහ අධ්‍යාපන කලාපය
## Gampaha Education Zone

### දෙවන වාර ඇගයීම - 2025
### Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 08 | විෂයය Subject: බුද්ධ ධර්මය | කාලය Time: පැය 02 |

නම : ....................................................................................................................................

★ අංක 01 සිට 20 තෙක් ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

01. බුදුරජාණන් වහන්සේ විසින් ගැටළු නිරාකරණය කළ අවස්ථාවක් නොවන්නේ,
   1. ආනන්ද හාමුදුරුවෝ පැවිදි කරවීම
   2. කාන්තාවන්ට පැවිද්ද ලබා දීම
   3. චුල්ලපන්තක හිමියන්ට පැවිද්ද ලබා දීම
   4. මුචලින්ද නාගරාජයන්ගේ ආරක්ෂාව ලැබීම

02. 'අප ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ උතුම් තෙමඟුල නිමිති කරගෙන ලෝකවාසී බෞද්ධයෝ සමරන උත්සවය වන්නේ,
   1. වෙසක් උත්සවය
   2. පොසොන් උත්සවය
   3. ඇසළ උත්සවය
   4. උඳුවප් උත්සවය

03. සංඝ භේදය ඇති කිරීම සඳහා බුදුරජාණන් වහන්සේගෙන් වර පහක් ඉල්ලා සිටියෙ කවුරුන් ද?
   1. සැරියුත් තෙරුන්
   2. දෙව්දත් තෙරුන්
   3. මුගලන් තෙරුන්
   4. රාහුල තෙරුන්

04. බුදු රජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිඹිබු වන ආචාරශීලී ගුණාංගයක් නොවන්නේ,
   1. සුහදශීලී කතා බහ
   2. ආගන්තුක සත්කාරය
   3. අල්ප ශබ්දතාවය
   4. අතිශයෝක්ති බව

05. ''මහනෙල් සුවඳමය'' යන කවිය රචනා කළේ කවුරුන් විසින් ද?
   1. එස්. මහින්ද හිමි
   2. ඇම් ඇල් සිල්වා ගුරු මුහන්දිරම් තුමා
   3. ශ්‍රී වජිරඥාන හිමි
   4. ශ්‍රී රාහුල හිමි

06. සම්මෝදක යනුවෙන් හඳුන්වන්නේ,
   1. කනට සුව දෙන කතා බහ කරන්නෙක්
   2. සතුටු සාමීචි කතා ඇත්තෙකි
   3. විවෘත කතා බහ ඇත්තෙකි
   4. පළමුවෙන්ම කතා කරන්නෙකි

07. තමාගේ වෙනත් කටයුතු සියල්ල පසෙකින් තබා සිතට නගා ගැනීමට සුදුසු බැවින් ධර්මය හඳුන්වන්නේ කුමන නමකින්ද?
   1. ඕපනායික
   2. ඒහිපස්සික
   3. අකාලික
   4. සන්දිට්ඨික

08. අප බෝධි සත්වයන් වහන්සේ බුද්ධත්වය ලැබුවේ වයස අවුරුදු කීයේදී ද?
   1. 33 දී
   2. 34 දී
   3. 35 දී
   4. 36 දී

09. ධර්ම රත්නයේ ගුණ ආකාර කීයද?

1. 6 යි　　2. 7 යි　　3. 8 යි　　4. 9 යි

10. අත් පොත් තැබීම යනුවෙන් පැරණි සම්ප්‍රදායේ හැඳින්වූයේ,

1. සරණ මංගල්‍ය
2. ඉඳුල් කට ගෑම
3. ගෘහ ප්‍රවේශ මංගල්‍ය
4. අකුරු කියවීමේ මංගල්‍ය

✦ අංක 11 සිට 15 දක්වා ඇති වගන්ති හරි නම් ( ✔ ) ලකුණ ද වැරදි නම් ( ✖ ) ලකුණ ද යොදන්න.

11. කරන කියන හැම දෙයක් ගැන ම විමසිලිමත් වීම අගසව් චරිත වලින් ගත හැකි එක් ආදර්ශයකි. (　)
12. යම් කෙනෙක් මුල දී පමා වී සිට පසුව නොපමාව කටයුතු කරයි නම් හෙතෙම දියුණුවට පත්වේ. (　)
13. අප ඇඳුම් ඇඳිය යුත්තේ මැසි මදුරු උවදුරු වලින් ආරක්ෂා වීම සඳහා පමණි (　)
14. අන්සතු වූ වස්තුවක් තමාගේ යයි සිතා වැරදීමකින් ගැනීමෙන් වුව ද දෙවැනි ශිල් පදයට හානි වේ. (　)
15. අජාසත්ත රජතුමා පියා වනුයේ කොසොල් රජතුමා ය. (　)

✦ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

( වේදේහ රජු / බිම්බිසාර රජු / අනේපිඬු සිටුතුමා / ආයුක්ඛය / උභයක්ඛය )

16. මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥාව පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා ..................................................... බොහෝ අවස්ථා වල නොයෙකුත් ගැටළු ඉදිරිපත් කළේය.
17. සත්ත්වයාගේ ආයුෂ ගෙවීයාම නිසා මරණයට පත්වීම ..................................................... මරණය නම් වේ.
18. ..................................................... වේළුවනාරාම විහාරය කරවා බුදු සසුනට පූජා කළේය.
19. සැවැත්නුවර ..................................................... විසින් දෙව්රම් වෙහෙර කරවන ලදි.
20. ආයුෂය ද කර්ම ශක්තිය යන දෙකම අවසන් වීමෙන් සත්තවයාගේ මරණය සිදුවීම .....................................................මරණය නම් වේ. ( 2 × 20 = 40 )

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20යි. තෝරා ගත් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

01. (i) දෙවන වාරයට අදාළව ඔබ කළ ඇගයීම කුමක්ද?
(ii) ඒ සඳහා ඔබ යොදාගත් පාඩමේ නම කුමක්ද?
(iii) එය ඉදිරිපත් කිරීමට ගුරුවරයාගෙන් ලැබුණු උපදෙස් 2ක් ලියන්න.
(iv) මෙම පාඩම පාදක කරගත් ජාතක කතාවේ නම කුමක්ද?
(v) පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියවුණු යුගය කුමක්ද?
(vi) මෙම පාඩමට අදාළව මහෝෂධ පඬිතුමා විසඳූ ප්‍රශ්න දෙක කුමක්ද?
(vii) වේදේහ රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ දෙදෙනෙකු නම් කරන්න.
(viii) මහෝෂධ පඬිතුමාගේ දෙමාපියන් නම් කරන්න.
(ix) මෙම පාඩමෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.
(x) ඔබ ඉගෙනගත් ජාතක කතාවේ ඇතුළත් පාරමිතාව කුමක්ද? (ලකුණු 2 × 10 = 20)

02. (i) සිව්බඹ විහරණ නම් කරන්න.
(ii) ලෝකයේ පුද්ගලයන් හතර ආකාරයක් වේ. එයින් තුන්දෙනෙකු නම් කරන්න.
(iii) අන් අයගේ සුභ සිද්ධි වෙනුවෙන් ඔබට කළ හැකි කටයුතු 5ක් ලියන්න. (2 + 3 + 5 = 10)

03. (i) සීලය යනු කුමක්ද?
(ii) දසශිල් වල පිළිවෙළින් මුල් ශික්ෂාපද තුන ලියන්න.
(iii) ඔබ පාසල් ශිෂ්‍යයෙකු ලෙස ශිල් සමාදන්වීමේ වැදගත්කම කුමක්ද? (2 + 3 + 5 = 10)

04. (i) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' යන පාලි පාඨයේ තේරුම ලියන්න.
(ii) කයෙන් සිදුවන අකුසල කර්ම තුනක් නම් කරන්න.
(iii) කේලම් කීම නරක ක්‍රියාවක් වන්නේ කුමක් නිසාද? කෙටියෙන් පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

05. (i) චතුරාර්ය සත්‍යයේ දෙවන සත්‍ය නම් කරන්න.
(ii) බුදු දහම අනුව තණ්හාව තුන් ආකාර වේ. ඒවා නම් කරන්න.
(iii) තණ්හාව දුකට හේතු වන අයුරු පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

06. (i) සම්බුද්ධ ශාසනයේ අඩක් පමණ පවතින්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය නිසා නේද? මෙය පැවසුවේ කවුද?
(ii) සිඟාලෝවාද සූත්‍රයට අනුව හිත මිතුරන් ඇසුරු කිරීමේ අනුගමනය කළ යුතු පිළිවෙත් 3ක් ලියන්න.
(iii) අඹුසැමි සබඳතා වඩාත් ශක්තිමත් වීමට ස්වාමියා විසින් බිරිඳට ඉටුකළ යුතු යුතුකම් මොනවාද?
(2 + 3 + 5 = 10)

07. (i) ත්‍රි ශික්ෂායෙහි පඤ්ඤා ශික්ෂාවට අයත් අංග 2 ලියා දක්වන්න. (ල. 2)
(ii) සම්මා සංකප්පයේ තුන් ආකාරය ලියා දක්වන්න. (ල. 3)
(iii) සම්මා ආජීවය සැකෙවින් ලියා දක්වන්න. (ල. 5)

07. පහත සඳහන් මාතෘකා වලින් 2ක් තෝරාගෙන කෙටි සටහනක් ලියන්න.
(i) අවමංගල්‍ය චාරිත්‍ර
(ii) අෂ්ඨගරු ධර්ම
(iii) හිත මිතුරු සබඳතා
(iv) සැරියුත් මහ රහතන් වහන්සේ (5 + 5 = 10)